# උපසම්පදා සංකල්පය

ගරු අභංගම රතනසිරි හිමි

උප+සං යන පූර්වනිපාතයන් සමඟ එක්වූ "පද" ධාතුවෙන් උපන් රූපයකි උපසම්පද යනු. උප හා සං යනු පූර්ව නිපාතයි කී හෙයින් එයින් නැගෙන අරුත් පිළිබඳවත් විමසිය යුතුව ඇත. උප යන පූර්ව නිපාතය විවිධ ධාතූන් හා එක්ව විවිධාර්ත්ථයන් බිහිකරන බවට අමුතු සඳහනක් අවශ්‍ය නොවේ. උපනිසීදෙය්‍යා, උපනගරං යනාදි තන්හි පූර්ව නිපාතය වූ උප යන්නෙන් එකිනෙකට පටහැනි අර්ථයන් නහාලන හැටි උදහරණ වශයෙන් සලකත්ම "උපසම්පද" යන මේ තන්හි කිනම් අර්ථයක් දෙනු ඇද්දැයි විමසන්නට සිදුවෙයි. එසේ විමසීමේදී උප යනු උපරිමය යන අර්ථය සඳහා යෙදී ඇති බව පෙනීයයි. "සං" යන්නෙන් "සමුදය" යන අර්ථය මෙහිදී යොද ගැනීම උචිත වේ. සියල්ල සසඳාගත් කල "උපරිභාවසමාපන්නො" යන විස්තරය පරිදි උසස් බවට පැමිණි පුද්ගලයා මෙයින් හඟවයි. "භික්ඛුභාවොපි උපරිභාවො" යි විස්තර වන බැවින් භික්ෂු භාවයත් උපරිබවක් හැටියට සලකන බව පෙනියයි. අධිකාර්ථ හා ඊශ්වරාර්ථ සඳහාත් "උප" යන පූර්ව නිපාතය වැටුන හෙයින් අධිකයා, උත්තමයා, අධිපතියා වැනි අදහසක් උපසම්පද යන්නෙන් කියවෙයි. එසේ නම් සීලයෙන් හා ගුණයෙන් උපරිසම්පන්න පුද්ගලයාට වැඩියෙක් දක්නට නොලැබේ.

උපසම්පන්න පුද්ගලයාම භික්ෂූන් වහන්සේ යන නමින් හඳුන්වනු ලැබේ. භික්ෂූන් වහන් සේ යනු මෙහි යොද ඇත්තේ උපසම්පන්න පුද්ගලයා පරාමර්ශණය කරගෙනයි. විනයේ භික්ෂු නාමයට මුල් වන මහාසීල හතරක් ගණනින් පෙන්වතත් සියලු පාසටහන් ඇත් පා සටහනේ ඇතු ළත් වන්නාසේ තුන්සිකම ප්‍රාතිමෝක්ෂ සංවරයෙහි ඇතුළත් වේ. උපසම්පන්නයාගේ සීලය අධිසීල නමින් ගණන් ගනු ලැබේ. එයට වැඩි සීලයක් කැලම නැති.

සීලයෙහි නොපිහිටා කිසිදු ගුණදහමක් පිරිය නොහැකි නිසා නොවේ නම් හැම රහතන් වහන්සේටම පැවිදි වීමක් අවශ්‍ය නොවේ.

ප්‍රථම බෝධිය තුළදීම උපසම්පද කිරීමේ ක්‍රමය විකාශයට පත්වී ගියහැටි පැහැදිලිවේ. එසේ නොවී නම් උපසම්පදව කිරීම පිළිබඳ ආකාර භේදයන් දකින්නට නොලැබෙන්නට තිබිණි.

1. එහි භික්ඛු උපසම්පද
2. සරණාගමන උපසම්පද
3. ඔවාද පටිග්ගහන උපසම්පද
4. පඤ්හ ව්‍යාකරණ උපසම්පද
5. ගරු ධම්ම පටිග්ගහණ උපසම්පද
6. දූතෙන උපසම්පද
7. අට්ඨවාචික උපසම්පද
8. ඤත්තිචතුත්ථකම්ම උපසම්පද යයි උපසම්පද කිරීමේ ක්‍රම අටක් පෙන්වා ඇත. ඒ කවර ක්‍රමයකින් කළද උපසම්පදවේ තත්ත්වයෙන් වෙනසක් නොවේ.

මුලින්ම උපසම්පදව ලත් පංචවග්ගිය භික්ෂූන් වහන්සේලා උපසම්පදවට ඇතුළත් කළේ "එහි භික්ඛු" යන වචන මාත්‍රයෙනි. ඒ බව "ආසාළ්හී පුණ්ණමාය අට්ඨාරසහි දෙවතාකොටීහි සද්ධිං සොතාපත්ති ඵලෙ පතිට්ඨිතස්ස එහි භික්ඛු උපසම්පද අහොසි" යන විනයට්ඨ කථාවෙන් පැහැදිලිවෙයි. ඇසළ පුණු පොහෝද අටළොස් කෙළක් දෙවියන් හා එක්ව සෝවාන් පද ප්‍රාප්තබවද "එහි භික්ඛු" යනුවෙන් උපසම්පදව දුන්නේ සෝවාන් ඵලයට පැමිණීමෙන් පසුව බවද පෙනීයයි.

මේ උපසම්පදාව ප්‍රථම බෝධියේදීම අනුදැන වදාළ නිසාත් මෙහි උපාධ්‍යායයන් වහන්සේ බුදුරජාණන් වහන්සේම නිසාත් බැහැරින් කළයුතු කිසිවක් නොවීය. ශාසනාරම්භයේම නිසා කර්මවාක්‍යාදියක් හෝ පරිස සම්පත්තියක් ගැන සිත යොමු නොවේ. සරණාගමන උපසම්පදාවේදී උපාධ්‍යායයන් වහන්සේ පමණක් ප්‍රමාණ නොවන්නේ උභතො පාරිශුද්ධියක් අවශ්‍යවූ නිසාය. මෙබඳු වෙනසක් ඇති කලේ ආසයානුසය නොදන්නා කිසිවකුටත් මෙනම් පුද්ගලයා උපනිඃශ්‍රය සම්පන්න යයි තීරණය කළ නොහැකි බැවින් " එහි භික්ඛු " කියන්නට වෙනත් සමතෙක් නැති බැවිනි.

බුදුරජාණන් වහන්සේට එහි භික්ඛු උපසම්පදාවට සුදුසු නුසුදුසුකම් තෝරා ගැනීමේ ආයාසයක් නැති නිසා උන්වහන්සේට හැර අන් කිසිවෙකුටත් එහි භික්ඛු උපසම්පදාව දිය නොහැකිය. ඒ නිසාම එහි භික්ඛු උපසම්පදාව ලත් පිනැතියන් පහසුවෙන් ගණන් කළ හැකිවෙයි. ප්‍රථමයෙන්ම එහි භික්ඛු උපසම්පදාව ලබා ඇත්තේ

| | |
|---|---|
| පඤ්චවග්ගිය භික්ෂූන් වහන්සේ | 05 |
| යසකුලපුත් ප්‍රධාන භික්ෂූන් වහන්සේ | 55 |
| භද්‍ද වග්ගිය භික්ෂූන් වහන්සේ | 30 |
| පුරාණ ජටිල ප්‍රධාන භික්ෂූන් වහන්සේ | 1,000 |
| අගසවු ප්‍රධාන පිරිස | 250 |
| අංගුලිමාල | 01 |

සියල්ල එකතුව 1,341 මෙහි දක්වා ඇත්තේ මූලික කණ්ඩායම බැවින් මෙයට තවත් එක්විය යුතුය.

| | |
|---|---|
| සෙල බ්‍රාහ්මණ ප්‍රධාන | 300 |
| මහාකප්පින ප්‍රධාන | 1,000 |
| කපිලවස්තුවාසී කුලපුත්‍රයන් | 10,000 |
| පාරායන බ්‍රාහ්මණ ප්‍රධාන | 16,000 |
| | 27,300 |

මේ සංඛ්‍යා ලේඛන අනුව 27,300+1,341 ත් එක්කොට ගත් කල්හි බුදුරජාණන් වහන්සේගේ උපාධ්‍යායත්වය පමණකින් මහණ මහලු පැවිදි ලද්දහු 28,641 ක් දැක්විය හැකිය. මෙහිදී විශේෂත්වයක් හැටියට කියතොත් බාහිය දරුචීරිය මේ ගණයට වැටීමට උපනිඃශ්‍රය සම්පන්න නොවීමයි.

සරණාගමන මාත්‍රයකින් මහණ මහලු පැවිදි අනුදැන වදාළසේක් පබ්බජ්ජාපෙක්ඛක හා උපසම්පදපෙක්ෂකයින් ගණනින් වැඩෙත් වැඩෙත්ම සරණාගමන මාත්‍රයෙන් කායචිය පිරිමසා ගැනීමට මං පාදනු සඳහාය. අනතුරුව ඔවාද පටිග්ගහන —පඤ්හ ව්‍යාකරණ—ගරු ධම්මපටිග්ගහන දූතෙන — අට්ඨවාචික— ඤත්තිචතුත්ථ කම්ම යයි ක්‍රම කීපයක් ප්‍රකාශයට පත්ව ඇත. සොපාක පමණක් ප්‍රශ්න විස්සජ්ජන මාත්‍රයකින් උපසම්පදාව ලැබීම විශේෂ සිද්ධියකි. කෙසේ වෙතත් යම් යම් හේතූන් මත කලින් කල ටිකෙන් ටික වෙනස් වෙමින් අවුත් ඤත්ති චතුත්ථකම්ම උපසම්පදාවේදී නතර වූ බව පෙනේ. බුද්ධ පරිනිර්වාණයෙන් පසු ශික්ෂා පද වෙනස් කිරීම හෝ අලුතෙන් පැනවීමක් කැලම නැති හෙයින් අද ලබාගන්නා උපසම්පදා සීලය දිවිපුදා රැකිය යුතුය. උපසම්පන්න අවසාන පුද්ගලයාගේ සීල භේදයෙන් හෝ මරණයෙන් පසු මේ උතුම් බුද්ධ ශාසනයෙහි උපසම්පදාවක් නොලැබෙන්නේය. ප්‍රාතිමෝක්ෂ සංවර ශීලයෙන් පිරිහුන පැවිද්ද දෙකොන ගිනිගත් තිඹිරි දර කඩක්මෙන් නිරර්ථක දිවියකට පිවිසෙන හෙයින් එළඹ සිටි සිහියෙන් මෙකී තත්වය ආරක්ෂා කළ යුතුය. තමා නොදැනම වුවත් බිඳිය හැකි නිසයි එළඹ සිටි සිහියෙන් යුක්ත විය යුත්තේ. බෝර පහරකින් වත් බිඳලිය නොහැකි සේ සිතමින් ක්‍රියා කරන්නා දෙලොවින් පිරිහෙයි. එහෙයින් උපසම්පදා සංඛ්‍යාත පුඤ්ඤක්ඛෙත්ත ගුණය දිවි දෙවෙනි කොට ආරක්ෂා කරමින් නිවන් සුව ලබන්නට උත්සාහ වඩත්වා.

---

ආශ්‍රිත ග්‍රන්ථ
විනයට්ඨ කථා